**(හැඳින්වීම)**

අද ආගමන සමයේ තෙවන ඉරුදින හෙවත් ආනන්දයේ ඉරුදිනය යි.

අද පළමු දේව ප්‍රකාශනය මගින් දෙවි සමිඳාණෝ සිය පෙමින් ජෙරුසෙලම් වැසියනට නව ජීවනයක් උදා කරන බවත් ඔවුන් වෙතින් විනාශය පහකරන බවත් ප්‍රකාශ කරයි. කිසිවක් ගැන කරදර නොවී, සමිඳාණන් වහන්සේ තුළ නිතරම ප්‍රීති වන්නට දෙවන දේව ප්‍රකාශනය මගින් අපට ආරාධනා කරයි. අවංකව සහ සාධාරණව ජීවිත ගත කිරීම මගින් ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීමට සුදුසු ලෙස දිවි පෙවෙත ගත කිරීමට ඇවසි බව අද සුපුවත තුළින් ප්‍රකාශ වේ.

ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනයට සූදානම් වන අපට ද උන්වහන්සේගේ ප්‍රේමයෙන් අප හදවත් පුරවා ගනිමින්, එකිනෙකා කෙරෙහි ප්‍රේමයෙන් යුතුව කල් යවන්නටත් සමිඳාණන් තුළ ප්‍රීති ප්‍රමුදිත වන්නටත් අවැසි සුදතුම් වරම් ඉල්ලා භක්තියෙන් යුතුව මෙම දිව්‍ය යාගයට සහභාගී වෙමු.

**(විශ්වාසිකයන්ගේ යැදුම් )**

පිළිතුර - ස්වාමිනී, අප කරන යාච්ඤා අසා වදාළ මැනව.

1. ආදර දෙවි පියාණනී, සැබෑ ඇතුළාන්ත ප්‍රීතියක් අත්දකිමින් ඔබවහන්සේගේ ප්‍රේමයෙන් පිරෙන්නට අප සැම මෙහෙයවන ප්‍රැන්සිස් සුදතුම් පියතුමන් ඇතුළු පූජක හා පැවිදි සැම ද ශුද්ධ වූ සභා මාතාවගේ දේව දරු කැළ ද ශුද්ධාත්ම ආලෝකයෙන් නිරතුරු පුරවාලන පිණිස,

2. ආදර දෙවි පියාණනී, මෙම ආගමන සමය තුළ සැබෑ ජීවිත පරිවර්තනයක් ඇතිකර ගනිමින්, අවංකව සහ සාධාරණව ජීවිතය ගත කරන්නට ද සියල්ලෙහි දී ඔබවහන්සේට ස්තුති පූර්වක වෙමින් ප්‍රේමයෙන් සහ සතුටින් පිරුණු දිවි ගත කරන්නට ද අප සැමට අවැසි වරම් දානය කරන පිණිස,

3. ආදර දෙවි පියාණනී, උදා වන නත්තල් මංගල සමය තුළ අප සහෝදරයන්ගේ අවැසිතා පිළිබඳව වඩා සංවේදී වන්නට ද, අප සතු දේ අනෙකා සමඟ බෙදා හදා ගනිමින් , ක්‍රිස්තුන් වහන්සේ වෙතින් පැමිණෙන සාමය හා සතුට අනෙකා වෙත ගෙනයන්නට ද අවැසි වරම් දානය කරන පිණිස,

4. ආදර දෙවි පියාණනී, සියලු වැසියන් උදෙසා යහපත් දිවි පෙවෙතක් ද සුරක්ෂිත දේශයක් ද ගොඩනගමින්, තම ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට අවැසි නිවැරදි මග පෙන්වීම සහ දේව වරප්‍රසාද අප රට ජන නායකයන්ට නොමදව දානය කරන පිණිස,